2010 ජනවාරි මස 23 වැනි දා සෙනසුරාදා ඉරුදින පුවත් පතෙහි පලවූ ඉ-ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි ලංකා රාජ්‍ය ජාලය පිළිබඳ පලවූ සාවද්‍ය තොරතුරු නිවැරදි කිරීම

| චෝදනාව/ පැමිණිල්ල | පිළිතුර |
|---|---|
| ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සඳහා පරිගණක ජාලයක් නිර්මාණය කිරීමේ වැඩසටහන ලංකා රාජ්‍ය ජාලය නමින් 2005 වසරේදී ආරම්භ විය. ඒ සඳහා කොරියාවේ ආනයන අපනයන බැංකුවෙන් එක්සත් ජනපද ඩොලර් 15ක ණය මුදලක් ලබාගැනීමට කැබිනට් අනුමැතිය හිමිවූයේ එම ව්‍යාපෘතිය කොරියානු සමාගමකට ලබාදීමේ කොන්දේසියක්ද ඇතිවය. | ද්වී-පාර්ශික ණය ආධාරය ලබා දෙන අවස්ථාවේදී කොරියානු රජය විසින් පැනවූ කොන්දේසියක් අනුව මේ සඳහා ටෙන්ඩර් කැඳවිය හැක්කේ කොරියන් සමාගම් සඳහා පමණි.<br><br>කැබිනට් අනුමැතිය මගින් කිසිදු කොන්දේසියක් පනවා නැත. |
| ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඉදිරිපත්වූ කොරියා ටෙලිකොම් හා සැම්සුන් යන සමාගම් දෙකෙන් වැඩි මිල ගණන් ඉදිරිපත් කල සැම්සුන් සමාගමට ටෙන්ඩරය ලබාදීම පිටුපස සිටින්නේ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ බව දැන් අනාවරණයවී ඇත. | ලංකා රාජ්‍ය ජාලය සඳහා කොරියානු සමාගම් තුනක් (3) ක් ටෙන්ඩර් ඉදිරිපත් කරන ලදී. ඒවා නම් කොරියානු ටෙලිකොම් ආයතනය, සැම්සුන් ආයතනය හා KEBT ආයතන වන අතර ඉන් වඩාත්ම උචිත ටෙන්ඩර් යෝජනාව ලෙස කොරියානු සැම්සුන් ආයතනය ඉදිරිපත් කළ ටෙන්ඩරය තෝරා ගන්නා ලදී.<br><br>එමෙන්ම සැම්සුන් සමාගමට වඩා වැඩියෙන් මිල ගණන් ඉදිරිපත් කල කොරියානු සමාගමක් ද ඇත. |
| ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශය 2006 ජූලි 5 දින කැබිනට් මණ්ඩලය පිළිගත් අතර එය සැම්සුන් සමාගම සමග එක්සත් ජනපද ඩොලර් 14.8ක ගිවිසුමකි. කොරියානු සැම්සුන් සමාගමේ දේශීය නියෝජිත ආයතනය වන ඇසෙට් නෙට්වර්ක් සමාගමේ හිමිකරුවන්නේ ඩිල්ෂාන් වික්‍රමසිංහ නැමැත්තෙකි. ඔහු ජනාධිපති ආර්යාවගේ සොහොයුරාගේ පුත්‍රයාය. ඒ අනුව ශිරන්ති නැන්දා ඉ-ශ්‍රී ලංකා මහජන මුදල් ගසා කෑමට ඩිල්ෂාන් බෑනාට අත හිත දී ඇති ආකාරය ඔබගේ දැන ගැනීම පිණිස පහත පලවේ. | ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය ජාලගත කිරීම සඳහා කොරියානු සැම්සුන් සමාගම තනි ඉල්ලුම්කරුවකු ලෙස (සමාගම් එකතුවක් ලෙස නොව) සහ ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන නියෝජිතායතනය ගිවිසුමක් අත්සන් තැබුනු අතර ඇසෙට් නෙට්වර්ක් සමාගමක් මෙම ගිවිසුම සඳහා කිසිදු සම්බන්ධතාවයක් නොමැත.<br><br>එමෙන්ම ලංකා රාජ්‍ය ජාලය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා සමාගම් 5ක් උප කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කරන ලදී. ඒවා නම් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, මෙට්‍රොපොලිටන් ආයතනය, මිලේනියම් ටෙක්නොලොජීස් ආයතනය, කෝබියන් සමාගම සහ පවර්නෙට් ආයතනය. |
| මෙම භාණ්ඩ බදුවලින් නිදහස්කොට ගෙන්වා තිබුණත් ඊට වඩා උසස් තත්වයේ භාණ්ඩ ඊට වඩා අඩු මුදලකට මෙරට වෙළඳපොලෙන් ලබාගත හැකිව තිබීම. | තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන නියෝජිතායතනය ආරම්භ කර ඇති පනත මගින් තීරු බදු වලින් නිදහස් ආයතනයකි. මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සියලුම සමාගම් ඉදිරිපත් කර තිබුනේ සියලු උපකරණ කොරියාවෙන් ගෙන ඒමටයි. එම මිල ගණන් වලට වඩා අඩු මිල ගණන් වලට ලංකාවෙන් භාණ්ඩ මිල දී ගත හැකි වෙනත් ටෙන්ඩර්යන් ඉදිරිපත් කොට ඇත්තේ කොරියවෙන් ඊට වඩා මිලැති භාණ්ඩ ගෙන එමටයි. එසේම ණය ගිවිසුමේ මෙම |

| | |
|---|---|
| | ටෙන්ඩරයේ තවත් කොන්දේසියක් වනුයේ ණය මුදලෙන් 80% සඳහා භාණ්ඩ කොරියාවෙන් ගෙන්වා ගත යුතු බවයි. ඒ අනුව එම භාණ්ඩ කොරියානෝ නොව ලංකාවෙන් සැපයිය යුතු යයි තහංචි පැනවීමට ණය ලාභී රටට/ ආයතනයට හිමිකමක් නොමැත. |
| Central UPS 123ක් එකක් ඩොලර් 1598.29 බැගින් ගෙන්වා ඇතත් එය මෙරට වෙළඳපොලේ ඩොලර් 800කි. | මෙම ව්‍යාපෘතිය මගින් අඛණ්ඩ විදුලි බල සැපයුම් යන්ත්‍ර (Central UPS) 325 ආනයනය කර ඇති අතර, ඉන් එකක මිල ඩොලර් 1598.29 කි. මෙය 2 KVA අඛණ්ඩ විදුලි බල සැපයුම් යන්ත්‍රයක් වන අතර මේ සඳහා අවුරුදු 3 ක පූර්ණ වගකීමකට බැදෙන අතර ඒ සඳහා උපකාරක සේවයක් හා තාක්‍ෂණික සේවයක් පිහිටුවා ඇත. එමෙන්ම ඕනෑම සේවා බිඳ වැටීමකදී මෙම උපකරණය යථාතත්වයට පත්කරන තෙක් එවැනිම උපකරණයක් ආයතන සඳහා එම අවස්ථාවේදීම ලබා දෙයි.<br><br>මෙම භාණ්ඩද 80% - 20% නීතිය අනුව කොරියාවෙන්ම ගත යුතු භාණ්ඩ වන හෙයින් ලංකාවේ මේ මිලට වඩා අඩු මිලැති භාණ්ඩ තිබුන ද ඒවා මිල දී ගත නොහැකිය. |
| Xeleron PC 3225 ක් ගෙන්වා ඇත්තේ එකක් ඩොලර් 1394.19 බැගිනි. සාමාන්‍ය වෙළඳපොලේ එහි මිල ඩොලර් 350-450 අතර වේ. | මෙම පරිගණකය සඳහා දෘඩාංග හා මෘදුකාංගද ඇතුලත්ය. (512 MB RAM/ 80 HDD), මෙම පරිගණකය සඳහා XP Home edition ලබා දී ඇති අතර Office 2003 package හා Antivirus kit ඇතුලු Desktop Management Agent ද ලබා දී ඇත.<br><br>මෙම උපකරණ අවුරුදු 3 ක පූර්ණ වගකීමකට බැදෙන අතර ඒ සඳහා උපකාරක සේවයක් හා තාක්‍ෂණික සේවයක් පිහිටුවා ඇත. එමෙන්ම ඕනෑම සේවා බිඳ වැටීමකදී මෙම උපකරණය යථාතත්වයට පත්කරන තෙක් එවැනිම උපකරණයක් ආයතන සඳහා එම අවස්ථාවේදීම ලබා දෙයි.<br><br>මෙම භාණ්ඩද 80% - 20% නීතිය අනුව කොරියාවෙන්ම ගත යුතු භාණ්ඩ වන හෙයින් ලංකාවේ මේ මිලට වඩා අඩු මිලැති භාණ්ඩ තිබුන ද ඒවා මිල දී ගත නොහැකිය. |
| lpg Hard disk drive 325 ක් එකක් 1175.19 බැගින් ගෙනැවිත් ඇත. ලංකාවේ එහි මිල ඩොලර් 350-450 අතර වේ. | මෙම ව්‍යාපෘතිය සඳහා lpg Hard disk drive කිසිදු අවස්ථාවක ආනයනය කර නොමැත. මෙය සාවද්‍ය තොරතුරකි.<br><br>එසේ සඳහන් මුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා සර්වර් යන්ත්‍ර 325 එකක් ඩොලර් 1175.19 බැගින් ආනයනය කර ඇත. මෙම සර්වර් යන්ත්‍ර සඳහා දෘඩාංග හා මෘදුකාංගද ඇතුලත්ය. (1 GB RAM/ 2 X 80 HDD), Cent O/s, Antivirus kit/ Network Management Agent යන මෘදුකාංග ස්ථාපනය කර ඇත. මෙම උපකරණ අවුරුදු 3 ක පූර්ණ වගකීමකට බැදෙන අතර ඒ සඳහා උපකාරක සේවයක් හා තාක්‍ෂණික සේවයක් පිහිටුවා ඇත. එමෙන්ම ඕනෑම සේවා බිඳ වැටීමකදී මෙම උපකරණය යථාතත්වයට පත්කරන තෙක් |

| | |
|---|---|
| | එවැනිම උපකරණයක් ආයතන සඳහා එම අවස්ථාවේදීම ලබා දෙයි.<br><br>මෙම භාණ්ඩද 80% - 20% නීතිය අනුව කොරියාවෙන්ම ගත යුතු භාණ්ඩ වන හෙයින් ලංකාවේ මේ මිලට වඩා අඩු මිලැති භාණ්ඩ තිබුන ද ඒවා මිල දී ගත නොහැකිය. |
| HP Scanjet 8200 ස්කෑනර් 325 ක් ගෙන්වා ඇත්තේ එකක් ඩොලර් 519 බැගිනි. එහි සත්‍ය මිල ඉන් අඩකි. එනම් ඩොලර් 254කි. | මෙම ස්කෑනර් යන්ත්‍රයෙහි සාමාන්‍ය වෙළඳපොලේ එහි මිල ඩොලර් 519 කට වඩා වැඩිය.<br><br>එමෙන්ම මෙම මෙම උපකරණ අවුරුදු 3 ක පූර්ණ වගකීමකට බැඳෙන අතර ඒ සඳහා උපකාරක සේවයක් හා තාක්‍ෂණික සේවයක් පිහිටුවා ඇත. එමෙන්ම ඕනෑම සේවා බිඳ වැටීමකදී මෙම උපකරණය යථාතත්වයට පත්කරන තෙක් එවැනිම උපකරණයක් ආයතන සඳහා එම අවස්ථාවේදීම ලබා දෙයි.<br><br>මෙම භාණ්ඩද 80% - 20% නීතිය අනුව කොරියාවෙන්ම ගත යුතු භාණ්ඩ වන හෙයින් ලංකාවේ මේ මිලට වඩා අඩු මිලැති භාණ්ඩ තිබුන ද ඒවා මිල දී ගත නොහැකිය. |
| ගිවිසුමට අනුව ගෙවීම් කරනු ලබන්නේ එක් එක් අදියරට අදාල ගුණාත්මක මට්ටම් පිළිබඳව පිරික්සීමෙන් අනතුරුවය. එහෙත් එසේ නොකර මුදල් ගෙවා අවසන් කර ඇත. | සෑම කාර්තුවක්ම අවසානයේ දි එම කාලය තුල / එම අදියරට අදාල ගෙවීම් කරනු ලැබේ. මේ දක්වා කරන ලද සෑම ගෙවීමකටම අදාල ව සියලුම සේවා මට්ටම් පරික්ෂා කොට ඇත. මේ දක්වා පරික්ෂා කොට ඇති සේවා මට්ටම් සහතික මෙහි දැක්වේ. |
| අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් අමතර කොටස් ප්‍රමාණයක් ගබඩා කරගෙන තිබිය යුතු වුවත් සමාගම සතුව එවැනි සංචිතයක් නොමැත. | අත්සන් ගිවිසුම මගින් සියළුම උපකරණ සඳහා 10% ක අමතර කොටස් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර එය එලෙසම මේ වන විටත් ක්‍රියාත්මක වෙයි. 2009 දෙසැම්බර් වනවිට තිබූ අමතර බඩු ලැයිස්තුව මෙහි දැක්වේ. |
| පරිගණක පද්ධති බිඳ වැටීම් හා සේවා සම්පූර්ණ නොවීමත් නොසැලකිලිමත් භාවයත් නිසා සිදුවන බිඳ වැටීම් ගැන පැමිණිලි විශාල ලෙස ලැබීමත් සිදුවේ. ඒ පිළිබඳ ඉක්මන් ප්‍රතිචාර නොදක්වා ප්‍රමාද කරයි. මෙය ගිවිසුමට පටහැනිය. වැඩි මිලක් ගෙවා ගෙන්වා ඇත්තේ බාල බඩුය. | මෙම ව්‍යාපෘතිය මගින් උපකාරක සේවයක් ඇති කොට ඇති අතර ලංකා රාජ්‍ය ජාලය මගින් ලබා දී ඇති උපකරණයක දෝෂයන් ඇත්නම් එම උපකරණ ඉතාමත් කෙටි කාලයකදී යථා තත්වයට පත්කිරීම සඳහා මෙම උපකාරක සේවය මගින් පහසුකම් සැලසේ. පරිගණක හෝ වෙනත් උපකරණයක් බිඳ වැටීමක් සිදු වුනොත් ඒවා යථා තත්වයට පත් කිරීමට නිශ්චිත කාලයක් ලබා දී ඇත. ඒ කාලය තුල එම උපකරණය යථා තත්වයට පත් නොකල හොත් දඩයකට සැම්සුන් ආයතනය යටත් වෙයි. මෙම ව්‍යාපෘතිය සඳහා සුවිශේෂ වූ සේවා මට්ටම් ගිවිසුමක් ඇත.<br><br>එම මට්ටමේ මේ දක්වා එක් වරක් පමනක් රැකීමට නොහැකිවී ඇත. ඒ සඳහා දඩ මුදලක් සැම්සුම් ආයතනයෙන් අය කරන ලදී. |

| | |
|---|---|
| සර්වර් සඳහා භාවිතා කිරීමට ගෙනවිත් ඇත්තේ සාමාන්‍ය PC 325 කි. | මෙම සර්වර් යන්ත්‍රය ආයතනය සඳහා proxy සර්වරය ලෙස පමණක් භාවිතා කරනා හෙයින් මෙහි ඇතුලත් පරිගණක දෘඩාංග හා මෘදුකාංග ඉහත සඳහන් ක්‍රියාවලිය සඳහා ඉතා උචිත වේ. |
| ගෙනවිත් ඇති ups හා රවුටර්ස් තත්වයෙන් බාලය. | ප්‍රසම්පාදන රෙගුලාසි අනුව අනුව පිළිගත් වෙළඳ නාමයක් සහිත උපකරණ ඉල්ලීමට නොහැක. ඉල්ලා සිටිය හැක්කේ අවශ්‍ය තාක්‍ෂණික පරිවිතර පමණි. මේ අනුව ඉල්ලා සිටි පිරිවිතර හා ගැලපෙන උපකරණ ලැබී ඇත.<br><br>මෙම සියළු උපකරණ අවුරුදු 3 ක පූර්ණ වගකීමකට බැදෙන අතර ඒ සඳහා උපකාරක සේවයක් හා තාක්‍ෂණික සේවයක් පිහිටුවා ඇත. එමෙන්ම ඕනෑම සේවා බිඳ වැටීමකදී මෙම උපකරණ යථා තත්වයට පත්කරන තෙක් එවැනිම උපකරණයක් ආයතන සඳහා එම අවස්ථාවේදීම ලබා දෙයි. |
| Xelron PC 325 ක් වැඩි මිලක් ගෙවා මිලදී ගෙන ඇති මුත් ඒවායේ වෙළඳ නාමය සඳහන් කොට නොමැත. (unbranded) | ප්‍රසම්පාදන රෙගුලාසි අනුව අනුව පිළිගත් වෙළඳ නාමයක් සහිත පරිගණක ඉල්ලීමට නොහැක. ඉල්ලා සිටිය හැක්කේ අවශ්‍ය තාක්ෂණික පරිවිතර පමණි. මේ අනුව ඉල්ලා සිටි පිරිවිතර හා ගැලපෙන පරිගණක ලැබී ඇත. අවශ්‍ය පිරිවිතර ගැලපේ නම් පරිගණක අබලන් හෝ ක්‍රියා විරහිත වුවහොත් නව පරිගණක දීම හෝ එය පැය 24ක් තුල අලුත්වැඩියා කොට ලබා දීම සිදුවේ නම් එම යෝජනාව අපගේ අඛණ්ඩ පරිගණක භාවිතා කිරීමේ අවශ්‍යතාවය සඳහා ගැලපුන හෙයින් මෙම පරිගණක ප්‍රතික්ෂේප කිරීමේ හැකියවක් නැත. |

පිළිතුරු දුන්නේ;

1. **වසන්ත දේශප්‍රිය මහතා,** අධ්‍යක්‍ෂ (රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය

2. **සුරංග ජයසූරිය මහතා,** ව්‍යාපෘති කළමණාකරු (ලංකා රාජ්‍ය ජාලය), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය